# (21) සිංහල භාෂාව හා සාහිත්‍යය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

I පත්‍රය - කාලය පැය 01යි.
බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය - කාලය පැය 02යි. ප්‍රශ්න 05කි. (මුළු ලකුණු 80කි.)
ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

1 ප්‍රශ්නය : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි.

2 ප්‍රශ්නය : රචනා ලිවීම. ලකුණු 25කි. (නිර්දිෂ්ට ව්‍යුහගත තේමා 4ක් අතරින් 1ක් තෝරා ගත යුතු ය.)

3 ප්‍රශ්නය : සාරාංශකරණය : ලකුණු 10කි.

4 ප්‍රශ්නය : අවබෝධය : ලකුණු 10කි.

5 ප්‍රශ්නය : ප්‍රායෝගික ලේඛනය : ලකුණු 15කි.
(වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු ය.)

III පත්‍රය - කාලය පැය 02යි. ප්‍රශ්න 07කි. (මුළු ලකුණු 80කි.)
1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ. 5, 6, 7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගත යුතු ය.

1 ප්‍රශ්නය : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි.

2 ප්‍රශ්නය : **නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් ගද්‍ය/පද්‍ය කොටස් ඇසුරෙන්** ප්‍රශ්නය සකස් කෙරෙන අතර අනුකොටස් 2කින් යුත් කොටස් 5කින් සමන්විත වේ. එක් අනුකොටසකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20කි.

3 ප්‍රශ්නය : වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු ය. ලකුණු 15කි.

4 ප්‍රශ්නය : වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු ය. ලකුණු 15කි.

5, 6, 7 ප්‍රශ්න : වෛකල්පික ප්‍රශ්න තුනකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු ය. ලකුණු 10කි.

අවසාන ලකුණු ගණනය කිරීම :

| | | | |
|---|---|---|---|
| | I පත්‍රය | = | 40 |
| | II පත්‍රය | = | 80 |
| | III පත්‍රය | = | 80 |
| | අවසාන ලකුණ | = | 200 ÷ 2 = 100 |

# (21) සිංහල භාෂාව හා සාහිත්‍යය

## I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

**1.** විවිධ සමාජ ප්‍රශ්න හමුවේ **කරබා ගෙන** සිටීම උගතුන්ට තරම් නො වේ.

(1) සාවධාන ව (2) නිහඬ ව (3) හිස නමා ගෙන (4) දෑත් පහළට හෙළා

**2.** ඔහුගේ සියලු වස්තුව **ඇලියාවට ගියේ** සුරාවට ලොල් වූ නිසා ය.

(1) සංහාරයට (2) පරිහානියට (3) විනාශයට (4) අස්ථාවරත්වයට

**3.** ග්‍රාම නිලධාරි මහතා ඉදිරිපත් කළ යෝජනාව **එක පයින්** පිළිගැනීමට ගැමියෝ සූදානම් වූහ.

(1) පය පෙරට තබා (2) සොයා නොබලා
(3) යටහත් පහත් ලෙස (4) සම්පූර්ණ කැමැත්තෙන්

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

**4.** නූතන විද්‍යාවන්හි _______________ සඳහා පැරණි විද්‍යාඥයන් ඉදිරිපත් කළ සිද්ධාන්ත බෙහෙවින් ඉවහල් වී ඇත.

(1) චිරස්ථිතිය (2) ප්‍රසාරණය (3) සංසරණය (4) පරිණාමය

**5.** භාෂාව හා සාහිත්‍යය අතර පවත්නා _______________ සම්බන්ධතාව පිළිබඳ ව බොහෝ විචාරකයෝ විවිධ අදහස් පළ කරති.

(1) අමරණීය (2) අවියෝජනීය (3) සම්භාවනීය (4) අනුල්ලංඝනීය

**6.** රචකයා තමා ලද අත්දැකීම් කාව්‍යය ආශ්‍රයෙන් _______________ කරන්නේ ස්වකීය පරිකල්පන ශක්තිය මෙහෙය වීමෙනි.

(1) ප්‍රතිනිර්මාණය (2) ප්‍රතිපෝෂණය (3) චිත්‍රණය (4) අභිවර්ධනය

**7.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) ඊශ්වර, ඖචිත්‍යය, පරමාදර්ශය, කෘෂිකාර්මික
(2) ධරණීතලය, වාගාලාප, චින්තාවලිය, වෘක්ෂලතා
(3) උත්ප්‍රේක්ෂා, දුර්භික්ෂ, කෞතුකාගාරය, දෘෂ්ටිකෝණය
(4) පුෂ්පෝපහාර, වෛද්‍යවරයා, ශිලාස්තම්භය, සෞඛ්‍යය

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) තුෂ්ණීම්භූත, ව්‍යංග්‍යාර්ථ, ඓරාවණ, ස්වාභාවික
(2) කැලණිය, විශ්ලේෂණ, ප්‍රථිමා, නිශ්ශබ්ද
(3) කණිෂ්ඨ, ප්‍රාසාංගික, ඖෂධ, විද්‍යුත්
(4) රිද්මයානුකූල, වීර්‍යය, පරිගනකය, නාමලේඛණ

**9.** පහත දී ඇති පද පේළිවල ඇතුළත් පදවල තුන්වන අක්ෂරයෙහි පිළිවෙළින් **ඉස්පිල්ල, පාපිල්ල, ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල** යෙදී ඇති වරණය වන්නේ,

(1) සන්නිවේදනය, පින්තාලිය, පළපුරුද්ද, පූජනීය
(2) මිහිරියාව, සාකච්ඡාව, රූපවාහිනිය, ප්‍රාදේශීය
(3) සංවිධානය, ඉසුරුමුණිය, නිර්මාණය, පරිශීලනය
(4) ස්වාධීනත්වය, පරිපූර්ණ, වැඩිහිටියන්, සංකීර්ණ

**10.** විභක්ති සමාසයට නිදසුනක් වන්නේ,

(1) සහසැස් (2) ගංවතුර (3) මඳනල (4) මුවකමල

**11.** **උක්ත නාම පද පමණක්** යෙදී ඇති වරණය තෝරන්න.

(1) නළඟනක්, පාරිභෝගිකයෝ, දරුවෝ, නිලධාරීහු
(2) අපි, හිතවතෙක්, ඇරියක, වෙළෙන්දෝ
(3) ලේඛකයෙක්, වානරයෝ, තිරිසනුන්, ගෙවිලියක්
(4) පඬිවරු, ගොවියන්, ධීවරයෝ, කම්කරුවන්

**12.** **උපසර්ගයක් රහිත** පදයක් ඇති වරණය තෝරන්න.

(1) අභිජාත, දුශ්චරිත, උද්ඝෝෂණ, ප්‍රත්‍යුපකාර
(2) ප්‍රභේද, අපද්‍රව්‍ය, පරගැති, සරතැස
(3) ප්‍රතිවාදී, පරිකල්පන, නිහඬ, අපකීර්තිය
(4) උපභාෂා, පරිශුද්ධ, විමුක්ති, අවතක්සේරු

**13.** '**යතුරට** දොර ඇරෙයි'. මෙහි යතුරට යන්නෙහි විභක්තිය වන්නේ,

(1) කර්ම (2) සම්බන්ධ (3) අවධි (4) කරණ

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ **අර්ථය නිවැරදි ව** දැක්වෙන වරණය තෝරන්න.

**14.** නවකතාව ගර්හිත කලාවක් නො ව විඥානය දියුණු කළ හැකි **යථාර්ථවාදී** කලාවක් බව මෙම නිර්මාණවලින් මනාව පැහැදිලි වේ.

(1) ඇත්ත ප්‍රකාශ කරන (2) යම් සේ පැවසෙන පරිදි
(3) නියම ස්වභාවය ප්‍රකාශ කරන (4) අර්ථය පැහැදිලි කෙරෙන

**15.** හෙළ බස පිළිබඳ ව මනා දැනුමක් ලබා ගැනීමට නම් **චිරන්තන** ගද්‍ය සාහිත්‍යය ද හදාළ යුතු වේ.

(1) නූතන (2) පුරාතන (3) සද්‍යතන (4) අද්‍යතන

**16.** ලෝකය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබා ගැනීම සඳහා යෝග්‍ය මගක් වන්නේ **දේශාටනය** යි.

(1) දේශ ගවේෂණය (2) දේශානුරාගය (3) දේශ ආක්‍රමණය (4) දේශ සංචාරය

**17.** මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) කෘදන්ත - රඟන, නටන, බලන, පවන
(2) තද්ධිත - රන්මුවා, ගැමියා, වරලස්, සිඟිති
(3) පූර්ව ක්‍රියා - ගොස්, නැමද, හඬා, බලා
(4) සන්ධි - ඔවුනොවුන්, ගුරුතුමා, යනෙන, වියවුල්

**18.** දී ඇති වචන ගොනු අතුරින් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයන් සමග බැඳී **නො පවත්නා** පද පේළිය වන්නේ,

(1) පෑන, පැන්සල, ගල්කුර, පින්සල
(2) අල්මාරිය, ඇඳ, පුටුව, මේසය
(3) අස්වැන්න, පොල්පලා, බිංකොහොඹ, කටුවැල්බටු
(4) නගුල, පෝරුව, බෝල්ලත්ත, ඇතිගොයියා

**19.** එක් එක් පද පේළිවල දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) **මෙරමා** - අන්‍යයන්; **ආපත්ති** - වැරදි; **පඬුවන්** - විද්වතුන්; **අර්චනීය** - පිදිය යුතු
(2) **අකුටිල** - වංක; **විලිකුන්** - ඉඳුණ; **නිරුක්ති** - අර්ථ; **අවිනෂ්ට** - විනාශිත
(3) **අස්වන්** - අස්වැදුණු; **තිස්පැය** - පැය තිහ; **අප්‍රතිහත** - අප්‍රමාණ; **පරිපෝෂිත** - පරපෝෂිත
(4) **උදක** - ජලය; **සම්මුතිය** - අනුමැතිය; **ආප්ත** - ආරෝපිත; **ආකර්ෂණය** - සංස්පර්ශය

**20.** මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නො** දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මව - දිනිති, මෑණි, ජනනි, අම්මා
(2) සතුට - හර්ෂය, ආනන්දය, සොම්නස, සන්තුෂ්ටිය
(3) තරිඳු - සිසි, සඳ, නිසයුරු, හිමකර
(4) විහඟ - සකුණ, සියොත්, ගුරුළු, දද

**21.** විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො** වන වරණය තෝරන්න.

(1) විෂාද - ආහ්ලාද
(2) පාපිෂ්ඨ - ධර්මිෂ්ඨ
(3) නවක - ආධුනික
(4) මුක්තිය - බන්ධන

**22.** අසම්භාව්‍ය **ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය තෝරන්න.

(1) කුකුළන් හඬලද්දී මම ගෙදරින් පිටත් වුණෙමි.
(2) කුඩා දරු කැල මුහුදු වෙරළේ එහා මෙහා දුවමින් විනෝද වූහ.
(3) උද්දාමයට පත් වූ ජයග්‍රාහකයෝ ප්‍රීති ඝෝෂා පැවැත් වූහ.
(4) වානරයෝ අතු අග පැන පැන කෙළි දෙලෙන් පසු වෙති.

**23.** වැරදි අදහස සහිත වරණය තෝරන්න.

(1) සංශයාර්ථය සහිත වාක්‍යයක අන්තර් වාක්‍යයේ කර්තෘ අනුක්ත රූපය ගනී.
(2) වාක්‍යයක් ඇත/නැත යන පදයකින් අවසන් වන විට කර්තෘ උක්ත විය යුතු ය.
(3) ඍ කාරය හා රකාරාංශය අතර උච්චාරණ සාම්‍යයක් පවතී.
(4) යංශය නිතර යෙදෙන්නේ හලන්ත ව උච්චාරණය කෙරෙන ශබ්දයක් සමග ය.

**24.** සෑම පදයක ම **අන්තඃස්ථ** අක්ෂරයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ගුවන, සබඳ, මහත, දරන
(2) බලය, සුවය, කතර, පිපුණු
(3) පහන, දහම, විවර, කියත
(4) සවන, සරණ, නියත, බලන

**25.** පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් සූචනය වන **නිවැරදි** ග්‍රාම නාමය ඇතුළත් වරණය වන්නේ,

(1) කෙහෙරතන්හගු (2) ඩාවෙරබණ්ල (3) ලොපොනල්වරු (4) කන්හබම්තො

● අංක 26 , 27 යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට **වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

**26.** ඔලිඳ ඇටෙනුත් ඇහැ කණ වෙනවා.

(1) ලොකු වේදනාවක් ඇති වීම
(2) කුඩා දෙයක් වුවත් ලොකු කොට සැලකීම
(3) සුළු දෙයකින් වුව ද බලවත් හානි සිදු වීම
(4) කුඩා දෙයක් වුවත් ලඝු කොට නොසැලකීම

**27.** කළුවා මාරපන් ගියා වගේ.

(1) විමසීමකින් තොර ව කටයුතු කිරීම
(2) අකමැත්තෙන් යමක් කිරීම
(3) ඇවිදීමට ආශාව දැක්වීම
(4) අරමුණකින් තොර ව වැඩ කිරීම

**28.** පහත (අ), (ආ) කොටස් යටතේ දැක්වෙන නම් හා එමගින් සැදී ඇති සංඛ්‍යා **වඩාත් නිවැරදි** ලෙස එකිනෙකට ගැළපෙන වරණය වන්නේ,

| (අ) | (ආ) |
|---|---|
| A තුදුස | E 19 |
| B සොළොස | F 16 |
| C තෙළෙස | G 14 |
| D එකුන් විස්ස | H 13 |

(1) A, E (2) C, H (3) B, G (4) D, F

- අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල** ව **නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) දරුවන් විභාගයෙන් සමත් වෙති'යි ගුරුවරුන් සිතති.
(2) දරුවෝ විභාගයෙන් සමත් වෙති'යි ගුරුවරු සිතති.
(3) දරුවන් විභාගයෙන් සමත් වෙති'යි ගුරුවරු සිතති.
(4) දරුවන් විභාගයෙන් සමත් වේ යැයි ගුරුවරු සිතති.

**30.** (1) වන අලි රංචුව ගම් වදී.
(2) විදුහල්පතිතුමා ශිෂ්‍යයන් ඇමතුහ.
(3) සුළඟින් ගස්වැල් ඉදිරි වැටෙති.
(4) කළමනාකරණ මණ්ඩලය රැස් විය.

**31.** A ඔහු පන්තියේ දක්ෂ ශිෂ්‍යයෙකි. මෙවර ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින් සමත් විය.
B ඔබ මගේ දියුණුව අපේක්ෂා කරන්නේ ය. ඒ සඳහා මට උපකාරී විය යුතු ය.
C අම්මා අද කොළඹ යයි. නැති නම් තාත්තා යයි.
D ශිෂ්‍යයෝ විනෝද චාරිකාවට සහභාගි වෙති. ගුරුවරයා ද ඊට සහභාගි වෙයි.

ඉහත වාක්‍ය, තනි වාක්‍ය වශයෙන් ගැළපීමේ දී නිපාත පද භාවිතයේ වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ වනුයේ,

E - සමග, F - නම්, G - හෝ, H - නිසා

(1) G, E, F, H (2) H, F, G, E (3) E, G, H, F (4) F, H, G, E

- පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ,

**32.** මම ගෙදර ගියා ම මැණියෝ බෙහෙවින් සතුටු වුණා.

(1) මං ගෙදර ගිය කල්හි මැණියෝ බෙහෙවින් සතුටු වුණා ය.
(2) මම ගෙදර ගිය කල්හි මැණියන් බෙහෙවින් සතුටු වුණේ ය.
(3) මා ගෙදර ගිය කල්හි මැණියන් බෙහෙවින් සතුටු වුවෝ ය.
(4) මා ගෙදර ගිය කල්හි මැණියෝ බෙහෙවින් සතුටු වුහ.

**33.** **තද කළු අකුරෙන් මුද්‍රිත** පදවල අර්ථ නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.

රත දරිනි **නාලිය**
ගමනින් සදිසි **නාලිය**
එපුර **සරනා ලිය**
කවුරු නම් හැකි වෙද **වනාලිය**

(1) නා දලු, ඇතින්න, හැසිරෙන කාන්තාව, වර්ණනා කිරීම
(2) වර්ණනා කිරීම, හැසිරෙන කාන්තාව, ඇතින්න, නා දලු
(3) නා දලු, ඇතින්න,වර්ණනා කිරීම, හැසිරෙන කාන්තාව
(4) ඇතින්න, නා දලු, හැසිරෙන කාන්තාව, වර්ණනා කිරීම

**34.** රූපකයක් සහිත වරණය තෝරන්න.

(1) පෙර කල් ජාතියේ පැතුවා වැන්නේ
(2) කන්නට පැන්නා මෙන් වැලහින්නී
(3) තී සැටි බමුණන් මේ රට නැද්දෝ
(4) රන්ලිය සිරින් බඳ වූ

**35.** 'එකෙණෙහි ස්ත්‍රියක් පුතු බුදුන් හා ඇතු මැදට දමා **කෝවේයකට** වැද ගියා ය.'

ඉහත සඳහන් පාඨයේ **කෝවේයකට** යනුවෙන් සඳහන් කර ඇත්තේ,

(1) කෝප්පය යි. (2) කුඩා වීදිය යි.
(3) දුම් පිට කිරීම යි. (4) කුඩා වේ තුඹස යි.

**36.** පහත සඳහන් කවියේ දී ඇති වරණ අතුරෙන් හතරවන පදය තෝරන්න.

රෑ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ
පාන්දරට යම්තම් ඇස පියෙන්නේ
හේනේ කඩුල්ලට එපිටින් සිටින්නේ
-------------------------------------------

(1) එගොඩ ගොඩේ උල ලේනා හඬන්නේ
(2) මෙගොඩ ගොඩේ මම සී පද කියන්නේ
(3) දෙගොඩ ගොඩින් කොතන ද නුඹ සිටින්නේ
(4) හීනෙන් ඇවිත් නෑනා අත වනන්නේ

**37.** ඇති මුත් මිණිමුතු අබරණ - දිනූ මුත් සම්පත් අපමණ
වුවහොත් රජ නපුරු වෙතේ - රුදු වග වලසුන් විලසේ

මෙම ගීත ඛණ්ඩය ඇතුළත් කෘතිය වන්නේ,

(1) හුනු වටයේ කතාව (2) වෙස්සන්තර නාටකය (3) මනමේ නාට්‍යය (4) සිංහබාහු නාට්‍යය

**38.** කමත් භාෂාවෙහි ගොවියාගේ දෑතට අල්ලා ගත හැකි ගොයම් ප්‍රමාණය හැඳින්වෙන්නේ,

(1) කැරැල්ල (2) ඇඳුත්ත (3) උප්පිඩි (4) අහුර

**39.** පහත සඳහන් කවියේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

සිඳු තුළ නො සිට නැඟි මෙන් වළඹ ගිනි වැට
දිසි යළ පබළ කලඹෙව් ලෙළ තරඟ පිට
බැඳ හළ රතු ගලක් ලෙස සඳ වෙලෙන වට
පැහැදුළ රිවි මඬල සකි පෙනෙය ත-නෙතට

(1) මිත්‍රය, ප්‍රභාවෙන් බබළන සූර්යයා වඩබා ගිනිපෙළ සමුද්‍රය තුළ නො සිට නැගුණාක් මෙන් ද සෙලවෙන දිය රැළි මත පබළු සමූහයක් මෙන් ද සැඳෑ වලාකුළුවලින් බඳින ලද රතු ගලක් මෙන් ද ඔබේ නෙත්වලට පෙනේ.
(2) මිත්‍රය, සමුද්‍රයේ වඩබා ගින්න මෙන් ද පබළු සමූහයක් මෙන් ද සන්ධ්‍යා වලාවෙන් බඳින ලද රතු ගලක් මෙන් ද සැඳෑ වලාවෙන් බඳින ලද සූර්යයා ඔබේ නෙත්වලට පෙනේ.
(3) සමුද්‍රයේ මතුවන වඩබා ගින්න මෙන් ද සෙලවෙන දිය රැළි මත පබළු සමූහයක් මෙන් ද සැන්දෑ වලාකුළුවලින් ආවරණය වූ රතු ගලක් මෙන් ද මිත්‍රය, සූර්යයා ඔබේ නෙත්වලට පෙනේ.
(4) මිත්‍රය, ප්‍රභාවෙන් බබළමින් සූර්යයා ඔබේ නෙත්වලට පෙනෙන්නේ සමුද්‍රයෙන් මතු වූ වඩබා ගින්නක් වැනි පබළු සමූහයක් මෙනි. සැඳෑ වලා අතර සැඟවුණු රතු ගලක් මෙනි.

**40.** දී ඇති ඡේදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

කාලීන සමාජ අවශ්‍යතාවලට සරිලන අයුරින් සිය සේවා ඉදිරිපත් කිරීමටත් හැඩ ගස්වා ගැනීමටත් අපොහොසත් වීමේ ප්‍රතිවිපාකවලින් පෙළෙන පුස්තකාල සේවාව ප්‍රතිසංවිධානය කොට එය කප්රුකක් බවට පත් කර ගැනීම යුගයේ අවශ්‍යතාව බවට පත් වී ඇත.

(1) කාලීන සමාජ අවශ්‍යතාවලට සරිලන සේ පුස්තකාල සේවාව ප්‍රතිසංවිධානය කොට එය කප්රුකක් බවට පත් කර ගැනීම යුගයේ වගකීම බවට පත් වී ඇත.
(2) පුස්තකාල සේවාව මුහුණ පා ඇති ප්‍රතිවිපාකවලින් ගලවා ගෙන එය සමාජ අවශ්‍යතා අනුව කප් රුකක් බවට හැඩ ගස්වා ගැනීම යුගයේ වගකීම බවට පත් වී ඇත.
(3) පුස්තකාල සේවාව ප්‍රතිසංවිධානය කොට කප්රුකක් බවට පත් කිරීම යුගයේ අවශ්‍යතාව ලෙස සැලකෙන්නේ සමාජ ඉල්ලුමට ගැළපෙන සේවා ඉදිරිපත් කිරීමටත් හැඩ ගස්වා ගැනීමටත් අපොහොසත් වීම නිසා ය.
(4) කාලීන අවශ්‍යතා ඉටු නොවීමෙන් ඇති වන ප්‍රතිවිපාකවලින් බැහැර වී පුස්තකාල සේවාව ප්‍රතිසංවිධානය කොට කප්රුකක් බවට පත් කිරීම යුගයේ අවශ්‍යතාවක් බවට පත් වී ඇත.

* *

# (21) සිංහල භාෂාව හා සාහිත්‍යය

## II පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියා දක්වන්න.

(අ) වනය

(ආ) වණය

(ii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද **දෙකක්** උපුටා දක්වන්න.

සිංහල කාව්‍යයේ අභ්‍යුදය සඳහා ඔහු කළ මෙහෙයට කාගේත් ප්‍රශංසාව පිරිනැමිණි.

(iii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) නැගෙනහිර හා දකුණ අතර ඇති අනුදිශාව

(ආ) හැමදා සිහිකටයුතු වූ

(iv) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල **තද කළු** අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ග නම් කරන්න.

(අ) අන්න **බලන්** සඳ රන්තැටියෙන් සුදු සීත ගඟුල් ගලනා

(ආ) මග රැඳුණ අද තෝ නසී - ගෙට **ගිය** අඹුව නසී

(v) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

අපරාධ මර්ධනය සඳහා රජය ගත් ක්‍රියාමාර්ග මහජනතාවගේ නිරීක්ෂනයට භාජනය විය.

(vi) පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නො ගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය හෝ සකස් කර ලියන්න.

(අ) පැදි කාව්‍යය

(ආ) මනුෂ්‍ය ගුණදම්

(vii) පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම්, ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) මගේ නැන්දා දක්ෂ කිවිඳියක් මෙන් ම ගායිකාවක් ද වන්නීය.

(ආ) වචන්නෝ ජයග්‍රහණය කරති'යි ගුරුතුමා ශිෂ්‍යයන්ට පැවසීය.

(viii) පහත දැක්වෙන පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.

(අ) අති + අවශ්‍ය

(ආ) සුරු + අත

(ix) පහත සඳහන් පද්‍ය පාඨයේ **තද කළු** අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

බලයුත් **තුමුල** මත **වරණිඳු** මෙදෙනැ' විස

(x) පහත දැක්වෙන යෙදුම් සඳහා ධීවර කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.

(අ) මසුන් මැරීම

(ආ) දැල් අදින පුද්ගලයෝ

(ලකුණු 2 × 10 = 20 යි)

**2.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන වචන **250කට** නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **සුදුසු මාතෘකාවක් ද** යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- යොදා ගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) ලෝකයේ තුනෙන් දෙකක් ජලයෙන් වැසී පැවතුණ ද පරිභෝජනය කළ හැක්කේ එයින් සීමිත ප්‍රමාණයකි. ඒ නිසා ජලය සීමිත සම්පතකි. ජලය නොමැති ව ජීවිත පවත්වා ගැනීමට හෝ සිතීමට හෝ නොහැකි ය. ලෝකයේ වෙනත් රටවල මෙන් ම අප රටේ ද බීමට ජලය නොමැති ව බොහෝ ජනයා පීඩා විඳිති. දූෂණයෙන් තොර ජලය සෞඛ්‍යයට හිතකර වේ. ජල දූෂණය හේතුවෙන් පානීය අවශ්‍යතා සපුරාගත නො හැකි වීම හා රෝග තත්ත්වයන්ට පාත්‍ර වීම ද සිදු වෙයි. එනිසා ජල මූලාශ්‍රය අපවිත්‍ර වීමට ඉඩ නො දී කවුරුත් එක් ව කටයුතු කළ යුතු ය.

(ආ) කැලි කසළ අවිධිමත් ලෙස පරිසරයට බැහැර කිරීමට බොහෝ දෙනා පුරුදු වී සිටිති. එයින් සිදු වන පාරිසරික හා සෞඛ්‍ය ගැටලු අප්‍රමාණ ය. කසළ කළමනාකරණය සඳහා නිසි ක්‍රමවේදයක් නො තිබීම මේ ප්‍රශ්නය දුර දිග යාමට හේතු වී තිබේ. ලොව ඇතැම් රටවල් කැලි කසළ ප්‍රතිචක්‍රීකරණය මගින් මහත් ආර්ථික ප්‍රතිලාභ අත්කර ගනිමින් සිටින කාලයක කැලි කසළ සම්පතක් බවට පෙරළා ගැනීමට අපට ද හැකි විය යුතු ය.

(ඉ) පරිගණකය වර්තමාන ලෝකයේ ජන ජීවිතයෙහි අත්‍යවශ්‍ය අංගයක් බවට පත් ව ඇත. ඇතැම් සංවර්ධිත රටවල ජනතාවට පරිගණකයේ සහාය නොමැති ව ජීවත් වීමට නො හැකි තත්ත්වයක් උද්ගත වෙමින් පවතී. කුඩා ඔරලෝසුවේ සිට ගුවන් ගමන් පාලනය වැනි සංකීර්ණ කාර්යයන් තෙක් පරිගණක භාවිතය පුළුල් වී ඇත. එහෙයින් රටේ යහපත උදෙසා පරිගණක දැනුම පිළිබඳ ව පාසල් දරුවන් මෙන් ම සමස්ත ප්‍රජාව ද දැනුවත් කිරීමේ කාලය දැන් එළඹ ඇත.

(ඊ) එදින වේලාසනින් නින්දට ගිය මා නිදි දෙව්දුව වැළඳ ගත්තේ ඉතා ඉක්මනිනි. සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වෙමින් සිටි නිසා පසුගිය දින කිහිපය ම නිදි වර්ජිත ව බොහෝ වේලා සිටීමට මට සිදු විය. මම සිහින ලොවකට පිවිසියෙමි. මොහොතකින් මා සිටියේ පිට්ටනියක් වැනි ස්ථානයක ය. රවුම් හැඩයෙන් යුත් යානාවක් එහි නවතා තිබෙන අයුරු දුටු මම එතැනින් වහා ඉවත් වීමට සූදානම් වීමි. නමුත් එයින් පිටතට ආ දෙදෙනෙක් වහා මා යානයට ඇද දමා ගත්හ. ඉන් අනතුරු ව සිදු වූ දේ කුමක් දැ යි පවා මට අදහා ගැනීමට නොහැකි විය.

(ලකුණු 25 යි)

**3.** පහත දැක්වෙන පාඨය වචන 50-60 අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.

අධ්‍යාපනය සහ සෞඛ්‍යය සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා සෘජු ව දායකත්වයක් සැපයිය හැකි ප්‍රධාන සමාජ යටිතල පහසුකම් වශයෙන් හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ සැමට නිදහස් අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා ලබා දීමේ ප්‍රතිපත්තිය, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා ලබාගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය වශයෙන් ඇති විෂමතා ඉවත් කර ඇත. කෙසේ නමුත් අධ්‍යාපන ප්‍රමිතිය එනම් එහි ගුණාත්මකභාවය සහ වෙළෙඳපොළ අවශ්‍යතාවලට සරිලන මට්ටමකට දියුණු කිරීම මගින් ආර්ථිකයට අඩු ආයකත්වයක් සපයන ප්‍රදේශවල ජනතාවට ආර්ථිකමය වශයෙන් වැඩි ක්‍රියාකාරිත්වයකින් යුතු අංශවල ශ්‍රම වෙළෙඳපොළට එක් වීමට අවස්ථාව සැලසෙනු ඇත. මෙය ශ්‍රම සංචලතාව වැඩි දියුණු කිරීමට සහ ආර්ථිකයට අඩු දායකත්වයක් සපයන ප්‍රදේශවල දරිද්‍රතාව අඩු කිරීමට උපකාර වනු ඇත. ශ්‍රී ලංකාව හා සමාන ආර්ථික මට්ටමේ සිටින රටවල් සමග සංසන්දනය කිරීමේ දී, අධ්‍යාපනය සම්බන්ධයෙන් විශේෂයෙන් ම, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් කරනු ලබන ආයෝජන සාපේක්ෂ ව අඩු මට්ටමක පවතී. එම නිසා අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ධෛර්යවත් කිරීමට දරන උත්සාහය ඇගයිය යුතු ය.

(ලකුණු 10 යි)

4. ශ්‍රී ලංකාව කලාපීය නාවික කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අභිලාෂය රජය ප්‍රකාශයට පත්කොට ඇත. අන්තර්ජාතික වෙළෙඳ කටයුතු සඳහා යොදා ගන්නා නැගෙනහිර - බටහිර සම්බන්ධ වන මුහුදු මාවතට ආසන්න ව වඩා උචිත ස්ථානයක පිහිටා ඇති නිසාත්, ඉන්දියානු උප මහාද්වීපයේ වැඩි වන වෙළෙඳ කටයුතු සහ ලෝකයේ අනෙකුත් කලාපත් සමග ඇතිකර ගෙන ඇති සහයෝගිතාවත්, ලංකාවට කලාපයේ නාවික කේන්ද්‍රස්ථානයක් ලෙස ඉස්මතු වීමට උපකාර වනු ඇත. වරාය අංශයේ ධාරිතාව සීමා වීම පිළිබඳ ගැටලුවට පිළියම් යෙදීම මෙන් ම නව තාක්ෂණය හඳුන්වා දීමෙන් වරාය මෙහෙයුම් නවීකරණය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ශ්‍රී ලංකාව, කලාපයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට කටයුතු කර ඇත. වරාය සහ නාවික කර්මාන්තය ආර්ථිකයේ ප්‍රමුඛ අංශයක් ලෙස සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකාවට පුළුල් ඉඩ ප්‍රස්තා පවතින අතර, ඉන් ඍජු හා වක්‍ර රැකියා බොහොමයක් උත්පාදනය කර ගැනීමට හැකි වනු ඇත. එමගින් රටට විදේශ විනිමය උපයා ගැනීමටත්, මධ්‍ය කාලීන ව රටේ ඍජු හා වක්‍ර රැකියා අවස්ථා රැසක් උපදවා ගැනීමටත් හැකියාව පවතී.

(i) කලාපයේ නාවික කේන්ද්‍රස්ථානයක් වීමට ශ්‍රී ලංකාවට උපකාර වන සාධක දෙකක් ලියන්න.

(ii) වරාය මෙහෙයුම් නවීකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂා කරන්නේ කවර අංශ පාදක කොට ගෙන ද?

(iii) ශ්‍රී ලංකාවට පුළුල් ඉඩ ප්‍රස්තා පවතින්නේ කවර කරුණක් උදෙසා ද?

(iv) විදේශ විනිමය උපයා ගැනීමට මෙහි ඉදිරිපත් කෙරෙන උපාය මාර්ග දක්වන්න.

(v) මෙම පාඨයට අනුව ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේ දී රජයේ අභිලාෂය වූයේ කුමක් ද?

(ලකුණු 10 යි)

5. සිරි සඳගම යෞවන සමාජයේ මාසික සභා රැස්වීමේ දී ඇති වූ සාකච්ඡාවකින් කොටසක් පහත දැක්වේ. මින් අදාළ කරුණු පමණක් තෝරා ගෙන **වචන 100කින්** පමණ යුතු අත් පත්‍රිකාවක් සකස් කරන්න. යෞවන සමාජයේ ලේකම් සුගත් ජයන්ත ඔබ යැයි සිතන්න.

- “ග්‍රාමීය ප්‍රදේශය තුළ ගෙවතු වගා තරගයක් ආරම්භ කිරීම අද රැස්වීමේ අරමුණයි”
- “අද කවුරුත් වෙළෙඳපොළට ම හුරු වෙලා. ගෙවත්තේ ඉඩකඩ තිබුණත් වගාවක් කරන්නේ නැහැ”
- “වගා තරගයක් පැවැත්වීමෙන් හැම දෙනා තුළ ම පෙලඹවීමක් ඇති කරන්න පුළුවන් වේවි”
- “වගා කරන්න අවශ්‍ය බීජ වර්ග බෙදා දුන්නොත් හොඳයි නේ ද?”
- “ඔව්, බටු, මිරිස්, වට්ටක්කා, මෑ, කරවිල, බණ්ඩක්කා, නිවිති වගේ බෝග සඳහා මේ තරගය සීමා කරමු.”
- “බීජ වර්ග වගේ ම අවශ්‍ය උපදෙසුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන්න ඒ අය කැමතියි”
- “දෙසැම්බර් මාසේ 20 වන දාට පෙර ඉල්ලුම් පත්‍ර ලබා ගනිමු”
- “මැයි මාසයේ අවසානය වන විට තරග පවත්වා අවසන් කරන්න පුළුවන් වේවි”
- “තරගයේ ජයග්‍රාහකයන්ට ත්‍යාග හා සහතික ලබා දීමෙන් වගාව ගැන උනන්දුව වැඩි වේවි නේ ද?”
- “ඔව් අපි 1, 2, 3 ස්ථාන තෝරමු. ඒ සඳහා රු.30000, රු.20000 හා රු.10000 බැගින් කෘෂි උපකරණ මිලදී ගැනීමට මුදල් වවුචර පිරිනමමු.
- “තරගයට සහභාගි වූ අයට සහභාගිත්ව සහතිකයකුත් පිරිනමන්න පුළුවන් වුණොත් හොඳයි නේ ද?”
- “ඔව් ඒ සඳහා අනුග්‍රහය දක්වන්න ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සූදානම් ව ඉන්නවා.”
- “මේ කරුණු ප්‍රදේශවාසීන්ට දැනුම් දෙන්නේ කොහොම ද?
- “ඒ සඳහා අත් පත්‍රිකාවක් සකස් කිරීමට අපි ලේකම්තුමාට පවරමු”

**නැතහොත්**

සරුගම ගම්මානයේ දැනට පවුල් 60ක් පමණ ජීවත් වේ. එම ගම්වාසීන්ට මුහුණ දීමට සිදු වී ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැති වීමයි. යෝජිත සනීපාරක්ෂක ජල ව්‍යාපෘතිය යටතේ සෞඛ්‍යාරක්ෂිත වැසිකිළි ඉදි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම හා වැසිකිළි භාවිතය පිළිබඳ ගම්වාසීන් දැනුවත් කිරීමත් අවශ්‍යාව ඇති බව දන්වා ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යැවීමට සුදුසු රාජකාරි ලිපියක් ලියන්න. (මේ සඳහා **වචන 100ක්** පමණ ප්‍රමාණවත් ය)

(ලකුණු 15 යි)

* * *

# (21) සිංහල භාෂාව හා සාහිත්‍යය

## III පත්‍රය

**සැලකිය යුතුයි :**

* උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු** ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) 'නුවර ගන්නා තබා පවුර ළඟට යන්නටත් සමර්ථ එක ද සත්ත්වයෙක් නැති'

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය ලියැවුණු සාහිත්‍ය යුගය නම් කරන්න.

(ii) 'දැසේ කඳුළැලි පිස දා බලනෙමි - හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක - පුංචි පුතා රජ කරනු පෙනේ'

(අ) මේ පැදිය උපුටා ගත් කවි පෙළේ රචකයා කවරෙක් ද?
(ආ) මෙහි දැක්වෙන පරිදි කවියාගේ අපේක්ෂාව කුමක් ද?

(iii) 'උඹ මේ ගමේ ඉන්න කවුරු හරි කසාද බැඳ ගනින්'

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙසේ ප්‍රකාශ කිරීමට හේතුව කුමක් ද?

(iv) දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි

(අ) මේ කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) 'දිය', 'දිය' යන දෙපදවල අර්ථ වෙන් වෙන් ව ලියන්න.

(v) මීට කලින් නේ ද මේක ගෙනත් දෙන්න තිවුණෙ? මටත් ඕක ඕන කෙරුව නම් එහෙම?

(අ) මේ ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද?
(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගෙන් සිදු වූ වරද කුමක් ද?

(vi) වේ රුදු දෝසා කළ මේ දේ
මා පුතු නො තකා විපාකේ

(අ) මෙහි රුදු දෝසයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
(ආ) මෙහි 'මා පුතු' යනුවෙන් හඳුන්වනු ලබන තැනැත්තාගේ නම ලියන්න.

(vii) (අ) අමාවතුර ග්‍රන්ථය සඳහා පාදක වූ බුදු ගුණය කුමක් ද ?
(ආ) 'උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව' ඇතුළත් වන මුල් කෘතිය සඳහන් කරන්න.

(viii) නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහි කොට මෙලොවේ
යුතුකම ඉටු කළ යුතු වේ

(අ) මෙම පද්‍ය රචකයාගේ වෙනත් නිර්මාණ දෙකක නම් ලියන්න.
(ආ) මෙහි ඇතුළත් රූපකාර්ථවත් යෙදුම් උපුටා දක්වන්න.

(ix) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණවල රචකයන් නම් කරන්න.
(අ) වස්සානය (ආ) ගංගාවේ සංගීතය

(x) 'තාත්තා එනවා දැකලා මට බන්නවන්න කතා කළා නේ ද?
(අ) මේ පාඨය ඇතුළත් සාහිත්‍ය නිර්මාණයේ රචකයා කවරෙක් ද?
(ආ) ඔහු ලියූ වෙනත් කෙටි කතා සංග්‍රහයක් නම් කරන්න. (ලකුණු 2×10 = 20 යි)

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) කොල **පවිටු** දුෂ්ට අධර්මිෂ්ඨ වූ **නිකෘෂ්ට** අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල, තෝ ධර්ම යුද්ධය කෙරෙමි' යි කියා ගොසින් තට මුනුබුරු තරමටත් නැති ඉතා බාල තැනැත්තන් වැඳ පී ය.

(අ) මේ පාඨය හා සම්බන්ධ සිද්ධිය කෙටියෙන් ලියන්න.
(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න.

(ii) අග පිපි මල් මලිගිය ලිය කැලේයා
**වග** බැඳ **හෙන** රජ හස පුල් විලේයා
ළග තුරු මල් ගිලිහුණු **රොනවු'ලේයා**
මඟ බැස යව පළ හෙළ වැලි තෙලේයා

(අ) මෙහි වැලිතලා ආශ්‍රිත ස්වාභාවික පරිසරයෙහි දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ඉදිරිපත් කරන්න
(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න.

(iii) සතර දෙනෙකු කෙරෙහි විස්වස් නැති සොර පෙර මා සබඳහ'යි විස්වස් නොකට යුත්තෙ යැ. තමා පළමු **අතොට** හුන් කොළ 'මා පෙර **වළඳ ගත්තෙ** යැ' යි විස්වස් නොකට යුත්තෙ යැ. රජ මා හා සබඳහ'යි විස්වස් නොකට යුත්තෙ යැ. ස්ත්‍රී 'මට වශ්‍ය යැ'යි විස්වස් නො ද කටයුත්තෙ යැ කී යැ.

(අ) මේ පාඨයේ දැක්වෙන පරිදි විශ්වාස නොකළ යුතු දෙදෙනෙකු නම් කරන්න.
(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න.

(iv) ගැල් රකිනවුගේ පුත, 'බර උසුලන්නවුගේ පුත', 'කුමකුත් නො දත්තවුගේ පුතැ'යි කිය කියා නළවයි. සිටුපුත්හු ද, ගැල් රඳවා ලා හුන් තැන දී ගොන්ට තණ ගෙනවුන් ලති. කෙළි ලළු පෑ ඇවිදි තැන ලත් දෙයක් යන එන තැනට අදිති.

(අ) මේ පාඨයෙහි ඇතුළත් වර්ණනයට පාදක වූ අවස්ථාව කෙටියෙන් ලියන්න.
(ආ) මෙහි දැක්වෙන සිටුපුත්‍රයා කරන කාර්යයන් දෙකක් දක්වන්න.

(v) මා පියා හැර දමා
යන්නෙ අප කෙලෙස දෝ
වලට ගොස් විඩා වී
පැමිණි විට නැත කෙනෙක්
අහර පිස දෙන්නටා
හුදෙකලා මේ ලෙනේ
ඉන්නෙ ඔහු කෙලෙස දෝ

(අ) මේ ගීයෙන් සිංහසීවලීගේ චරිතයෙහි කෙබඳු ලක්ෂණ ප්‍රකාශ වේ ද?
(ආ) මෙහි දැක්වෙන පරිදි පියාට මුහුණ දීමට සිදු වන දුෂ්කරතා දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 4×5 = 20 යි)

**3.** උම්මග්ග ජාතකයෙන් මහෞෂධ පඩිතුමාගේ

(i) ස්ථානෝචිත ප්‍රඥාවත්
(ii) සානුකම්පිතභාවයත්

සිත් ගන්නා පරිදි ඉදිරිපත් වෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

(i) හැඟීම්වලට වහල් වීම
(ii) අභියෝග ජය ගැනීම

යන කරුණු උග්ගසේන නම් සිටු පුත්හුගේ කථා වස්තුවෙන් ඉස්මතු කොට දැක්වීමට කතුවරයා සමත් වූ ආකාරය එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

**4.** ගුත්තිල කාව්‍යය රසවත් වීමෙහි ලා
(i) වක්‍රෝක්ති භාවිතයත්
(ii) ශබ්ද රස ජනනයත්

හේතු වෙයි. උදාහරණ **දෙක** බැගින් දක්වමින් මේ අදහස පැහැදිලි කරන්න.

**නැතහොත්**

වීදාගම මාහිමියෝ හංස සන්දේශය රචනා කිරීමේ දී
(i) කැරගල ගම් පියසෙහි සශ්‍රීකත්වය ද
(ii) පාරිසරික සෞන්දර්යය ද

රසිකයා හමුවේ විසිතුරු ලෙස ගෙනහැර දක්වති. නිර්දිෂ්ට කොටස් ඇසුරෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**5.** ගැමි ජීවිතයේ හුරු පුරුදු ජීවන අත්දැකීම් සිත් කාවදින ලෙස උපදේශ මගින් ඉදිරිපත් කිරීමට ජන කවියා තුළ පැවති අපූරු හැකියාව උදාහරණ **තුනක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**6.** "බැද්දේගම නව කතාවේ එන පුංචි මැණිකා චරිතයෙන් නිරූපණය වන්නේ සොබා දහමෙන් ද සමාජ බලවේග මගින් ද පීඩාවට පාත්‍ර වූ තැනැත්තියකි". උදාහරණ **තුනක්** දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

**7.** නියං සමය නිමා කරමින් ඇද හැළුණු වැස්සෙන් පසු පරිසරයේ ඇති වන උද්දීප්තිය අපූර්වාකාරයෙන් චිත්‍රණය කිරීමට 'වස්සානය' කවි පෙළේ රචකයා සමත් වී ඇති ආකාරය උදාහරණ **තුනක්** දක්වමින් විමසන්න.

(ලකුණු 10 යි)

* * *